## ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

## පෙර පාසල් / දිවා සුරැකුම් මධ්‍යස්ථාන සහායිකා (සේවා පැවරුම් පදනම මත) තනතුරට බඳවා ගැනීම

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පූර්ව ළමාවිය සංවර්ධන සහ දිවා සුරැකුම් මධ්‍යස්ථානයෙහි පෙර පාසල් / දිවා සුරැකුම් මධ්‍යස්ථාන සහායිකා (සේවා පැවරුම් පදනම මත) තනතුර සඳහා බඳවා ගැනීමට පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**සුදුසුකම්:-**

i. අ.පො.ස. (සා.පෙළ) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනකදී අවම වශයෙන් විෂයයන් 06 කින් සමත් වී තිබීම.

සහ

ii. වයස අවුරුදු 45 ට නො වැඩි විය යුතුය.

- මාසික වැටුප - රු.35,000/- (ස්ථාවර)

- පිළිගත් දිවා සුරැකුම් මධ්‍යස්ථානයක අවම වශයෙන් වසර 02ක පළපුරුද්දක් සපුරා ඇති අයදුම්කරුවන් කෙරෙහි ප්‍රමුඛතාවක් දක්වනු ලැබේ.

මෙ සම්බන්ධ උනන්දුවක් දක්වන සුදුසුකම් ලත් අයදුම්කරුවන් තමන් විසින්ම සකසා ගත් අයදුම්පතක් සමඟ අධ්‍යාපන සුදුසුකම් හා වෙනත් සුදුසුකම් සනාථ කිරීම සඳහා අදාල සහතිකවල සහතික කල පිටපත්ද සමඟ 2025.09.30 දිනට හෝ එදිනට පෙර අනධ්‍යයන ආයතන අංශයට භාර දීමට හෝ නියෝජ්‍ය ලේඛකාධිකාරී / අනධ්‍යයන ආයතන, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ගංගොඩවිල, නුගේගොඩ යන ලිපිනයට ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුවේ. ලියුම් කවරයේ වම් පස උඩ කෙළවරේ ඉල්ලුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතුවේ.

ලේඛකාධිකාරී

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය.
2025.09.15